THE EDUCATION STATE

අපගේ පහළ බාලාංශය, වික්ටෝරියානු අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුවේ බාල ළමා විය භාෂා වැඩසටහනට (Early Childhood Language Program) සහභාගිවේ!

## ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවක් ඉගෙනීම මාගේ දරුවාට වැදගත් වන්නේ ඇයි?

බාල වියේදී අමතර භාෂා ඉගෙනීමෙන් බොහෝ ප්‍රතිලාභ අත්වන බවට අධ්‍යාපන විශේෂඥයන් සොයාගෙන තිබේ. මේවා අතර, ඔබගේ දරුවාට සිතීමට, ගවේෂණය කිරීමට සහ ගැටළු නිරාකරණය කර ගැනීමට උපකාර කිරීම, සහ ඔවුන්ගේ පෙර කියවීම් සහ පෙර ලිවීම්වලට උපකාරවීම ඇතුලත්වේ.

වෙනත් භාෂාවකින් ඉගෙනීම මගින් භාෂා හැසිරෙන ආකාරය සම්බන්ධයෙන් ඔබගේ දරුවා හට වඩා යහපත් අවබෝධයක් ලබාදේ. ඔබගේ දරුවා කථාකරන භාෂාව ව්‍යාක්තව කථා කරයි නම්, ඒ මගින් දරුවාගේ ආත්මාභිමානය සහ සංස්කෘතික අනන්‍යතාවය ශක්තිමත් කෙරේ.

අපගේ පහළ බාලාංශවල විවිධ භාෂා නිපුණතාවයන් උනන්දු කිරීම මගින්, වික්ටෝරියානු ප්‍රාන්තය මගින් වඩා ශක්තිමත් දේශීය ප්‍රජාවන් ඇතිකල හැකි අතර දරුවන්ව වඩා ගෝලීයකරණයවූ සහ සම්බන්ධවූ ලොවකට සූදානම් කල හැකිය.

## වෙනත් භාෂාවකින් ඉගෙනීම මගින් මාගේ දරුවාගේ ඉංග්‍රීසි භාෂා වර්ධනය හට බලපෑමක් ඇතිවේද?

වෙනත් භාෂාවක් ඉගෙනීම මගින් ඔබගේ දරුවාගේ සමස්ථ සාක්ෂරතාව දියුණු කරගත හැකි අතර භාෂාවන් සාමාන්‍යයෙන් හැසිරෙන ආකාරය අවබෝධ කරගත හැකිය.

ඔබගේ නිවසේ ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවක් කථා කරයි නම්, ඒ මගින් ඔවුන්ගේ සමස්ථ භාෂා නිපුණතාවයන් වැඩිදියුණු කරගත හැකිවේ.

## වැඩසටහන උගන්වන්නේ කෙසේද?

ඔබගේ දරුවා හට ගවේශණය, ගැටළු නිරාකරණය කිරීම සහ වෙනත් භාෂාවකින් ක්‍රීඩා කිරීම මගින් දිගින් දිගට ඉගෙනීමට උනන්දු කෙරේ.

තමා කරන කටයුතු සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් ප්‍රවර්ධනය කරන, ක්‍රීඩා, කලා, සංගීතය සහ කථාන්දර කීමෙහි ඔවුන්ව නිරත කරන සහ ඔවුන් භාවිතා කරන වචන වැඩි කිරීම මගින් දරුවන් හිතාමතා කරන ඉගැන්වීමේ ප්‍රවේශයක් ඔස්සේ ඔවුන් ඉගෙනීම සිදු කරයි.

භාෂාව භාවිතය එදිනෙදා ඉගෙනීමට සහ ක්‍රියාකාරකම්වලට බැදෙනු ඇති අතර මේ මගින් දරුවන් හට ඔවුන් විසින්ම භාෂාව භාවිතා කිරීමට පුළුල් අවස්ථාවක් ලබාදේ.

## මෙම භාෂාව තෝරා ගත්තේ කෙසේද?

කුමන භාෂාව ඉගැන්විය යුතුද යන්න තීරණය කලේ ප්‍රජාවන්, පහළ බාලාංශයේ අවශ්‍යතා සහ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් සිටීම සහ සමහර අවස්ථාවල ප්‍රාථමික පාසලේ ඉගෙනගත් භාෂාව දිගටම ඉගෙනීමට උපකාර කිරීම සඳහාය.

පහළ බාලාංශය මගින් වැඩසටහන සම්බන්ධයෙන් නිතිපතා අළුත් තොරතුරු ලබාදෙන අතර උනන්දුව ඇති අය හට නිවසේදීද භාෂාව කථා කිරීමට අවස්ථාව ලබාදෙනු ඇත.

VICTORIA State Government | Education and Training